# වාණිජ ධාරා

වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

## ගිණුම්කරණය - 33

### නිපුණතාව 16

**16 ප්‍රාග්ධන ආයෝජන තීරණ**


අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : අප්සරා අමරසිංහ මිය

ර/ උඩගම මහා විද්‍යාලය


වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක

ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

# 16
# ප්‍රාග්ධන ආයෝජන තිරණ

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|
| 16.1 දිගුකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සැලසුම් කරයි. | • දිගුකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය |
| 16.2 විවිධ ප්‍රාග්ධන ඇගැයීම් ක්‍රම භාවිත කර ආයෝජන තීරණ ගැනීමට සහාය වෙයි. | • ආයෝජන ඇගැයීමේ ශිල්ප ක්‍රම<br>• ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය<br>• පිළිගෙවුම් කාලය<br>• ශුද්ධ වර්තමාන අගය<br>• මුදලේ කාලීන වටිනාකම්<br>• ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය<br>• ආයෝජන ඇගැයීමේ ශිල්ප ක්‍රම මත ආයෝජන තීරණ ගැනීම |

## හැඳින්වීම

ව්‍යාපාරයක අරමුදල් නිසි පරිදි කළමණාකරණය කර ඉහළ ප්‍රතිලාභ සහිත ව්‍යාපෘන්හි යෙදවීම තුළින් අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරිම මූල්‍ය කළමණාකරණයේදි ඉතා වැදගත්වේ


මෙය කළමණාකරුවෙකු විසින් ගනු ලබන ඉතා වැදගත් තීරණයක් වන අතර ඒ සඳහා අවශ්‍ය තොරතුරු කළමණාකරුවන්ට සැපයිම මෙම පාඩම මගින් සිදු වේ

**කළමනාකරණ තීරණ කෙටිකාලීන හෝ දිගු කාලීන විය හැකි අතර ඉදිරි වර්ෂ කිහිපයක් පුරා ප්‍රතිලාබ අපේක්ෂාවෙන් ව්‍යාපාරයේ මුදල් යෙදවීම සම්බන්ධයෙන් වන දිගු කාලීන තීරණ ප්‍රාග්ධන ආයෝජණ තීරණ ලෙස හැඳින්වේ**

# ප්‍රාග්ධන ආයෝජන තීරණ (දිගුකාලීන තීරණ )

මූලික පද හා සංකල්ප :

සංකල්ප සිතියම




ඉදිරි වර්ෂ කිහිපයක දී ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාරයේ අරමුදල් යෙදවීම සම්බන්ධ තීරණ **ප්‍රාග්ධන ආයෝජන තීරණ** ලෙස හැඳින්වේ.

ගන්නා තීරණය දිගු කාලයක් සඳහා බලපාන බැවින් ඒ කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විය යුතු ය.

**නිදසුන්**

- දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම
- කම්හලක් ඉදි කිරීම
- රථගාලක් ඉදි කිරීම
- නව දුරකථන පද්ධතියක් ඉදි කිරීම

**දිගුකාලීන තීරණ වැදගත් වීමට හේතු ( ලක්ෂණ )**

- ✓ යෙදීමට අපේක්ෂිත අරමුදල විශාල වටිනාකමකින් යුක්ත වීම
- ✓ දිගුකාලීන නිසා අවදානමක් තිබීම
- ✓ දිගුකාලීනව ගන්නා තීරණය වෙනස් කළ නොහැකි වීම
- ✓ දිගුකාලයක් පුරා ආයෝජිත මුදල රැඳී තිබීම

## දිගුකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය

1. විකල්ප ආයෝජන හඳුනා ගැනීම
2. **විකල්ප ආයෝජන සඳහා මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම**
3. **විකල්ප ආයෝජන ඇගැයීම**
4. සුදුසු ව්‍යාපෘතිය තෝරාගැනීම හා ක්‍රියාත්මක කිරීම


ඉහත පියවර අතරින්

- ➢ **මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම**
- ➢ **විකල්ප ආයෝජන ඇගැයීම**

යන පියවරය දෙක පමණක් මෙහිදි සලකා බැලේ

## මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම

මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේ ප්‍රධාන අවස්ථා




ආයෝජනයක ආරම්භක අවස්ථාවේ සිට අවසානය දක්වා වූ මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් පුරෝකථනය කිරීම මෙහිදී සිදුවේ මුදල් ප්‍රවාහ මතම පදනම්ව ආයෝජණ තීරණ ගනු ලබයි ගිණුම්කරණ ලාභය හෝ වෙනත් ප්‍රතිලාබ සලකනු නොලබයි

## මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී සැලකිය යුතු කරුණු

1. බදු පසු මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගැනීම

2. වර්ධක මුදල් ප්‍රවාහයන් පමණක් සැලකිල්ලට ගැනීම.
   එනම් පවතින මුදල් ප්‍රවාහ නොව ආයෝජනය නිසා වැඩි වන මුදල් ප්‍රවාහ පමණක් සැලකිල්ලට ගැනීම මෙයින් අදහස් වේ.

3. ආයෝජනයට අදාළ සියලු වක්‍ර බලපෑම් නිසා වන මුදල් ප්‍රවාහ ඇතුළත් කිරීම (නව ආයෝජනය නිසා පවතින ආයෝජනවල ආදායම වැඩිවීම හා අඩු වීම)


4 දැනටමත් දරා ඇති පිරිවැය (ගිලුණු පිරිවැය) මුදල් ප්‍රවාහයක් ලෙස නොසැලකීම

5. පොලී මුදල් ප්‍රවාහයට ඇතුළත් නොකිරීම

6. ක්ෂය වීම් හා මුදලින් වැය නොකරන නමුත් වියදම් සේ වාර්තා කර ඇති අයිතම මුදල් ප්‍රවාහයක් සේ නොසැලකීම

### මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේ ප්‍රධාන අවස්ථා

1. මූලික ආයෝජන අවස්ථාවේ මුදල් ප්‍රවාහ
2. වාර්ෂික මෙහෙයුම් මුදල් ප්‍රවාහ
3. පර්යන්ත මුදල් ප්‍රවාහ (අවසාන අවස්ථාවේ)




### මූලික ආයෝජනයේ මුදල් ප්‍රවාහ
ආයෝජණයක ආරම්භක අවස්ථාවේ ඊට සම්බන්ධ මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් වේ

**නිදසුන්**
- ❖ නව වත්කම (ආයෝජනය) මිලට ගැනුම් පිරිවැය (බදු සහිතව)
- ❖ ව්‍යාපාර ස්ථානයට ගෙන ඒමේ හා සවි කිරීමේ පිරිවැය
- ❖ ආරම්භක අවස්ථාවේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා
- ❖ පවතින වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල්

**වාර්ෂික මෙහෙයුම් මුදල් ප්‍රවාහ**
ආයෝජනය ක්‍රියාත්මක කළ පසු එය පලදායී කාලය තුළ මෙහෙයුම් කාර්යය සඳහා යොදා ගැනීමෙන් ජනිත වන මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් වාර්ෂික මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙස හැඳින්වේ.

**නිදසුන් :**
- අත්පිට විකුණුම්වලින් මුදල් ලැබීම්
- අත්පිට ගැනුම් සඳහා මුදල් ගෙවීම්
- මෙහෙයුම් වියදම සඳහා ගෙවීම්
- ක්ෂය වීම් හැර ස්ථාවර වත්කම් නඩත්තු වියදම් සඳහා ගෙවීම්
- බදු ගෙවීම්
- මෙහෙයුම්වලට අදාළ වෙනත් ගෙවීම්

**පර්යන්ත මුදල් ප්‍රවාහයන්**
ආයෝජනයේ ජීව කාලය අවසානයේ දී ඇති වන මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් පර්යන්ත මුදල් ප්‍රවාහ ලෙස හැඳින්වේ.

**නිදසුන් :**
- ආයෝජනයේ සුන්බුන් විකිණීමෙන් ලැබෙන මුදල්.
- කාරක ප්‍රාග්ධනය ආපසු අය කර ගැනීම
- වෙනත් ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන මුදල්

මෙම මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් අතර වෙනස **ශුද්ධ මුදල් ප්‍රවාහය** ලෙස හැඳින්වේ

**අභ්‍යාස**
සමාගමක් ගැණුම් මිල රු 500 000 ක් වන යන්ත්‍රයක් මිලට ගැනීම අපේක්ෂා කරයි
සවි කිරිමේ වියදම රු 50 000 කි ආරම්භක කාරක ප්‍රාග්ධනය රු. 20 000 කි එය ඵලදායී ජීවකාලය අවසානයේ දී ලබා ගත හැකි ය. දැනට පවතින යන්ත්‍රය රු. 200,000කට විකිණිය හැකි බව තක්සේරු කර ඇත.නව යන්ත්‍රයකට අදාළ අපේක්ෂිත තොරතුරු මෙසේ ය.

අපේක්ෂිත විකුණුම්


| **වර්ෂය** | **විකුණුම්** |
|---|---|
| 1 | 150 000 |
| 2 | 180 000 |
| 3 | 210 000 |
| 4 | 200 000 |
| 5 | 100 000 |

පළමු වර්ෂයේ වියදම වැඩි වීම රු. 20,000 යි. 2 හා 3 වර්ෂවල 10% බැගින් වැඩි වන අතර, 4 හා 5 වර්ෂවල 10% බැගින් අඩු වේ. යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය වූ වර්ෂ 5 අවසානයේ දී සුන්බුන් අගය රු. 50000 ක් ලබා ගත හැකි වේ.

**අවශ්‍ය වන්නේ**
1. මූලික ආයෝජනයේ වටිනාකම ගණනය කිරීම
2. වාර්ෂික ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය ගණනය කිරීම
3. පර්යන්ත මුදල් ප්‍රවාහය ගණනය කිරීම

# ආයෝජන ඇගැයිම

මූලික පද හා සංකල්ප




විකල්ප ආයෝජණ අවස්ථාවන්ට අදාල ශුද්ධ මුදල් ප්‍රවාහයන් ඇසුරින් ඒ ඒ ආයෝජණ අවස්ථාව ඇගයීමට ලක්කල යුතුය

එම ශිල්ප ක්‍රම වර්ග දෙකකි

- මුදලේ කාලීන අගය සැලකිල්ලට නොගන්නා ශිල්ප ක්‍රම
- මුදලේ කාලීන අගය සැලකිල්ලට ගන්නා ශිල්ප ක්‍රම

## මුදලේ කාලින අගය නොසලකා ආයෝජනය ඇගැයිමට යොදා ගන්නා ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකකි.

1. ආයෝජන ප්‍රතිලාභ අනුපාත ක්‍රමය
2. පිළිගෙවුම් කාල ක්‍රමය

## ආයෝජන ප්‍රතිලාභ අනුපාත ක්‍රමය (ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය )

යෙදූ ආයෝජනයට කොපමණ ප්‍රතිලාභයක් ලැබේ ද යන්න මෙම අනුපාතයෙන් අදහස් වේ. කාලච්ඡේදයේ ලාභය (බදු පසු ලාභය) කෙරෙහි පමණක් සැලකිල්ලක් දක්වයි.

**ගණනය කරන ආකාරය**

$$\text{ආයෝජන ප්‍රතිලාභය අනුපාතය} = \frac{\text{සාමාන්‍ය බදු පසු ලාභය}}{\text{සාමාන්‍ය ආයෝජනය}} \times 100$$

**ආයෝජන ප්‍රතිලාභ ක්‍රමයේ වාසි හා අවාසි**

**වාසි**

1. පහසු හා සරල ක්‍රමයක් වීම
2. අඩු පිරිවැයකින් ක්‍රියාත්මක කළ හැකි වීම
3. ලාභය පදනම් කර ගන්නා බැවින් මුදල් ප්‍රවාහයන් නැවත ගණනය කිරීමට අවශ්‍ය නොවීම

**අවාසි**

1. මුදලේ කාලීන අගය සැලකිල්ලට නොගැනීම
2. මුදල් ප්‍රවාහයන් සැලකිල්ලට නොගැනීම
3. ලාභය යොදා ගන්නා නිසා එහි දී සිදු වුන දෝෂ තීරණ සඳහා බලපෑම

**අභ්‍යාස**

1) ආරම්භක ආයෝජනය රු.700 000කි වර්ෂ 3 අවසානයේ මෙම ආයෝජනය රු. 100 000 වේ යැයි තක්සේරු කර ඇත. මෙම වර්ෂ තුනේ කාලච්ඡේද ලාභය මෙසේ ය.

රු.
1 - 200 000
2 - 120 000
3 - 80 000

**අවශ්‍ය වන්නේ**

ආයෝජන ප්‍රතිලාභ අනුපාත ගණනය කිරීම

2) ව්‍යාපාරයක් සතු අරමුදල් යෙදවීමට උචිත ආයෝජනයක් තෝරා ගැනීම සඳහා විකල්ප දෙකක් ඇත. ඒ සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | **පළමු ආයෝජනය (රු.)** | **දෙවන ආයෝජනය (රු.)** |
|---|---|---|
| ආයෝජනයේ පිරිවැය | 700 000 | 800 000 |
| 1 වර්ෂය | 90 000 | 80 000 |
| 2 වර්ෂය | 100 000 | 120 000 |
| 3 වර්ෂය | 110 000 | 150 000 |
| 4 වර්ෂය | 100 000 | 50 000 |

ආයෝජන දෙකේ ම කාලය අවසානයේ වටිනාකම පිළිවෙළින් 100 000ක් හා රු. 200 000ක් වේ.

**අවශ්‍ය වන්නේ :**

1. එක් එක් ආයෝජනයේ ආයෝජන ප්‍රතිලාභ අනුපාත ගණනය කිරීම
2. තෝරා ගත යුතු ආයෝජනය කුමක් ද? යන්න හේතු සහිතව ඉදිරිපත් කිරීම

# පිළිගෙවුම් කාල ක්‍රමය

මූලික ආයෝජනයේ වටිනාකම ආපසු අය කර ගැනීමට ගත වන කාලය පිළිගෙවුම් කාලය ලෙස හැඳින්වේ. ආයෝජනයේ වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය පදනම් කරගෙන පිළිගෙවුම් කාලය ගණනය කරයි

සෑම වර්ෂයක ම සමාන වූ ශුද්ධ මුදල් ප්‍රවාහ ලැබේ නම්

$$\text{පිළිගෙවුම් කාලය} = \frac{\text{මූලික ආයෝජනය}}{\text{වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය}}$$

**පිළිගෙවුම් කාල ක්‍රමයේ තීරණ නීතිය**

අඩු පිළිගෙවුම් කාලයක් සහිත ආයෝජනය තෝරාගත යුතුයි.

**පිළිගෙවුම් කාල ක්‍රමයේ වාසි හා අවාසි**

**වාසි**

1. මුදල් ප්‍රවාහයන් සැලකිල්ලට ගැනීම
2. ආයෝජන මුදල් ඉක්මනින් ලබා ගත හැකි වීම
3. ගණනය කිරීම පහසු වීම

**අවාසි**

1. සියලු මුදල් ප්‍රවාහ ගැන නොසැලකීම
2. මුදලේ කාලීන අගය නොසැලකීම
3. පිළිගෙවුම් කාලයෙන් පසු මුදල් ප්‍රවාහ කෙරෙහි අවධානය යොමු නොකිරීම

**අභ්‍යාස**

1 සමාගමක් රු. 250 000ක ආයෝජනයක් කර සෑම වර්ෂයක ම රු. 50000 බැගින් ශුද්ධ මුදල් ප්‍රවාහ අපේක්ෂා කරයි.

**අවශ්‍ය වන්නේ :**
පිළිගෙවුම් කාලය ගණනය කර මිලට ගත යුතු යන්ත්‍රය නිර්දේශ කරන්න.

2 සමාගමක් යන්ත්‍ර දෙකක මිල සලකා බලයි. එයට අදාළ ශුද්ධ මුදල් ප්‍රවාහ මෙසේ ය. යන්ත්‍ර දෙකෙහි ම ගැනුම් මිල රු. 600 000කි.

| | ශුද්ධ මුදල් ප්‍රවාහයන් රු. | |
|---|---|---|
| **වර්ෂය** | **යන්ත්‍රය A** | **යන්ත්‍රය B** |
| 1 | 180 000 | 280 000 |
| 2 | 220 000 | 70 000 |
| 3 | 200 000 | 150 000 |
| 4 | 190 000 | 200 000 |
| 5 | 260 000 | 140 000 |

**අවශ්‍ය වන්නේ :**
පිළිගෙවුම් කාලය ගණනය කර මිලට ගත යුතු යන්ත්‍රය නිර්දේශ කරන්න.

# මුදලේ කාලින අගය සැලකිල්ලට ගනිමින් ආයෝජන ඇගැයිම

## මුදලේ කාලින අගය

වර්තමාණයේ ලැබෙන මුදලක අගය අනාගතයේ ලැබෙන මුදල්වල අගයට වඩා වැඩි බව මෙහිදී සලකා බලයි ප්‍රාග්ධන පිරිවැය එනම් පොළිය මෙයට හේතුව ලෙස සලකයි මෙම මුදලේ කාලීන අගය පොලිය නැත්නම් ප්‍රාග්ධනයේ පිරිවැය නිසා වෙනස් වේ.

## ශුද්ධ වර්තමාන අගය ක්‍රමය

අපේක්ෂිත අනාගත මුදල ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මුලික ආයෝජණයේ අගය සමග ගලපමින් ආයෝජන ඇගයීමට ලක් කිරිම මෙහිදී සිදුවේ

ශුද්ධ වර්තමාන අගය සෙවීම සඳහා පියවර කිහිපයක් අනුගමනය කිරිම කළ යුතුය.

එනම් :

1. මුදල් ප්‍රවාහ ගණනය කිරිම
2. ශුද්ධ මුදල් ප්‍රවාහ ගණනය කිරීම
3. වර්තමාන අගය සෙවීම
4. ශුද්ධ වර්තමාන අගය සෙවීම

## වර්තමාන අගය

අනාගතයේ දී ලැබෙන යම් මුදල් වල අද වටිනාකම වර්මාණ අගය ලෙස සලකන අතර මෙය අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය ( ප්‍රාග්ධන පිරිවැය හෙවත් පොළිය) ඇසුරින් වට්ටම් කිරිමෙන් ගණනය කරනු ලබයි

## ශුද්ධ වර්තමාන අගය මත තිරණය

ශුද්ධ වර්තමාන අගය (ධන) අගයක් ගන්නා ආයෝජන පිළිගත යුතු බවයි. එක් ආයෝජනයක් පමණක් නම් ධන අගයක් සහිත ව්‍යාපෘතිය තෝරා ගත යුතු ය. ආයෝජන කිහිපයක් ඇති විට වැඩිම ධන අගය සහිත ව්‍යාපෘතිය තෝරා ගත යුතු ය.

## ශුද්ධ වර්තමාන අගය ක්‍රමයේ වාසි හා අවාසි

**වාසි :**

1. සියලු මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගැනීම
2. මුදලේ කාලීන වට්ටම් අනුපාතයන් තෝරාගත හැකි වීම

**අවාසි :**

1. මුදල් ප්‍රවාහ ගණනය කර ගැනීමට සිදුවීම
2. නිවැරදි වට්ටම් සාධකයක් තෝරා ගැනීමට අපහසු වීම

**<u>අභ්‍යාස</u>**

1 සමාගමක් රු 800 000 ක යන්ත්‍රයක් මිලට ගැනීම අපේක්ෂා කරයි

| **වර්ෂය** | **ශුද්ධ මුදල් ප්‍රවාහය** |
|---|---|
| | රු. |
| 1 - | 300000 |
| 2 - | 250000 |
| 3 - | 150000 |
| 4 - | 400000 |

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 |

**අවශ්‍ය වන්නේ :**
මුදල් ප්‍රවාහයන්ගේ 10% වට්ටම් සාධකය මත වර්තමාන වටිනාකම් ගණනය කරන්න.

2 සීමිත සුනෙත් පොදු සමාගම පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගැනිමට අපෙක්ෂා කරයි ඒ සඳහා අපෙක්ෂිත තොරතුරු පහත දැක්වේ

| | |
|---|---|
| ගැණුම් මිල | රු 500 000 |
| සවිකිරිමේ පිරිවැය | රු 100 000 |
| සුන්බුන් අගය | රු 100 000 |
| පවතින යන්ත්‍රයේ විකුණුම් මිල | රු 200 000 |
| ඵලදායි ජීවිත කාලය වසර | 05 යි |

නව යන්ත්‍රයේ අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු100 000 කි මෙය අවසානයේ ලබා ගත හැකිය අපෙක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය 12% කි

අපේක්ෂිත මෙහෙයුම් පිරිවැයේ ඉතිරය

| **වර්ෂ** | **ශුද්ධ මුදල් ප්‍රවාහ ( රු)** |
|---|---|
| 1 | 120 000 |
| 2 | 160 000 |
| 3 | 180 000 |
| 4 | 200 000 |
| 5 | 140 000 |

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.89 | 0.80 | 0.71 | 0.64 | 0ග57 |

**අවශ්‍ය වන්නේ**
1 ව්‍යාපෘතියේ මුදල් ගලා ඒම් සහ මුදල් ගලායමේ ලේඛනය සහ එහි ශුද්ධ වර්තමාන අගය
2 ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිලදී ගත යුතු ද යන්න නිර්දේශය

## මුලික පද Key Terms

| | |
|---|---|
| ප්‍රාග්ධන ආයෝජන තීරණ | Capital Investment Decisions |
| මුදල් ප්‍රවාහ | Cash Flows |
| ආයෝජන ඇගැයීම | Investment Appraisal |
| ආයෝජන ප්‍රතිලාභ අනුපාත ක්‍රමය | Accounting Rate of Return |
| පිළිගෙවුම් කාලය | Pay Back Period |
| ශුද්ධ වර්තමාන අගය | Net Present Value |

# මාසික පරීක්ෂණ ඇගයීම්

1) පහත ප්‍රකාශ වල සත්‍ය අසත්‍ය බව දක්වන්න

1) පිළිගෙවුම් කාලය පසුව උදාවන ආයෝජණ ව්‍යාපෘතිය තෝරා ගැනීම වඩා යෝග්‍ය වේ ……………..

2) අනාගතයේ ලැබෙන මුදල් වල වර්තමාන අගය පොළී අනුපාතයකින් වට්ටම් කර සොයා ගනියි ……………

3) යම් මුදලක් අනාගතයේ ලැබෙනවාට වඩා දැන් ලැබීම වඩා වාසි සහගත වේ ……………

4) මුදලේ කාල අගය සැලකිල්ලට ගනිමින් ආයෝජණ ඇගයීම වඩා යෝග්‍ය වේ ……………

5) ගිලුණු පිරිවැය මුදල් ප්‍රවාහයක් ලෙස සලකයි ……………

2) සමාගමක් මිලදී ගැනිමට අපේක්ෂිත රු 400 000 ක යන්ත්‍ර දෙකකට අදාලව පහත ශුද්ධ මුදල් ප්‍රවාහයන් ඉදිරිපත් කර ඇත

| **වර්ෂය** | **යන්ත්‍රය - A** | **යන්ත්‍රය - B** |
|---|---|---|
| 1 වර්ෂය | 200 000 | 100 000 |
| 2 වර්ෂය | 100 000 | 300 000 |
| 3 වර්ෂය | 200 000 | 100 000 |
| 4 වර්ෂය | 100 000 | 50 000 |
| 5 වර්ෂය | 300 000 | 100 000 |

**අවශ්‍ය වන්නේ**

(1) එක් එක් යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය ගණනය කරන්න
(2) පිළිගෙවුම් කාලය අනුව මිලට ගත යුතු යන්ත්‍රය තීරණය කරන්න
(3) ඉහත තීරණයේ යෝග්‍යතාවය පිළිගෙවුම් කාල ක්‍රමයේ දුර්වලතාවයක් ඇසුරින් පැහැදිලි කරන්න
(4) 10% වට්ටම් සාධකය යටතේ එක් එක් යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය ගණනය කරන්න

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

3) තේ කම්හලකට අවශ්‍ය ඇඹරුම් යන්ත්‍රයක් රු 600 000 කට මිලදී ගැනීමට අපෙක්ෂා කරයි එහි සුන්බුන් අගය වසර 4 ක් අවසානයේදී රු 100 000 කි අපේක්ෂිත වාර්ෂික ලාභයේ වැඩි විම් පහත පරිදි වේ

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| අපේක්ෂිත ලාභයේ වැඩිවිම | 500 000 | 200 000 | 300 000 | 400 000 |

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය 10% | 0.91 | 0.83 | 0.75 | 0.68 |

**අවශ්‍ය වන්නේ**

ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිලදී ගත යුතු ද යන්න නිර්දේශය

# පසුගිය විභාග ප්‍රශ්ණ

ගිණුම්කරණය 1 ප්‍රශ්ණ පත්‍රයෙහි 30 හා 50 ප්‍රශ්ණ දෙක ඉදිරිපත් කර ඇත

ගිණුම්කරණය 11 ප්‍රශ්ණ පත්‍රයෙහි ලකුණු 10/40 ක ප්‍රශ්ණ කොටසක් ඉදිරිපත් කර ඇත

ප්‍රශ්ණ පත්‍රයේ ලකුණු 100 න් ලකුණු 05 ක පමණ බර තැබිමක් සිදු කර ඇත

## ගිණුම්කරණය 1 ප්‍රශ්ණ පත්‍රයෙහි පසුගිය විභාග ප්‍රශ්ණ කිහිපයක්

### 2015 වර්ෂය අ. පො. ස. උසස් පෙළ ප්‍රශ්ණ අංක 30

සමාගමක් නිෂ්පාදය සදහා භාවිත කරන පැරණි යන්ත්‍රය වෙනුවට අළුත් යන්ත්‍රයක් ආදේශ කිරිමට සලකා බලමින් සිටි මෙම පැරණි යන්ත්‍රයේ මෙන් ම නව යන්ත්‍රයේද ඵලදායි ජීව කාලය වසර 4 කි පහත තොරතුරු ද දී ඇත

| **විස්තරය** | **පැරණි යන්ත්‍රය ( රු 000)** | **නව යන්ත්‍රය ( 000)** |
|---|---|---|
| ගැනුම් මිල | 9 000 | 10 000 |
| වර්තමාන විකුණුම් වටිනාකම | 4 000 | - |
| 4 වන වසර අවසානයේදී අපේක්ෂිත සුන්බුන් අගය | - | 2 000 |
| වාර්ෂික මෙහෙයුම් පිරිවැය( ක්ෂය නොමැතිව) | 4 500 | 3 000 |

නව යන්ත්‍රය මිලදී ගන්නේ නම් ආරම්භක ශුද්ධ මුදල් ගලා යෑම් සහ 4 වන වර්ෂයේ මුදල් ගලා ඒම

| | **ආරම්භක ශුද්ධ මුදල් ගාලා යෑම (රු 000)** | **4 වන වර්ෂයේ මුදල් ගලා ඒම (රු 000)** |
|---|---|---|
| (1) | 5 000 | 3 500 |
| (2) | 6 000 | 1 500 |
| (3) | 6 000 | 3 500 |
| (4) | 10 000 | 1 500 |
| (5) | 10 000 | 3 500 |

### 2015 වර්ෂය අ. පො. ස. උසස් පෙළ ප්‍රශ්ණ අංක 50

ඵලදායි ජීව කාලය වසර 5 ක් සහ සුන්බුන් අගය රු 300 000 ක් වු නව යන්ත්‍රයක් රු 100 000 කට මිලදී ගැනීමට සමාගමක් සැලසුම් කරමින් සිටි මෙම යන්ත්‍රයෙන් සෑම වර්ෂයකදී ම රු 110 000 ක වාර්ෂික ලාභයක් ඉපයිමට අපේක්ෂා කෙරේ මෙම යන්ත්‍රයෙන් ජනනය වන මුදල් ප්‍රවාහයන් එහි ඵලදායි ජීව කාලය තුළ සමානව සිදුවේ යැයි අපෙක්ෂා කෙරේ

මෙම ව්‍යාපෘතය සදහා පහත දෑ ගණනය කරන්න

(අ) 5 වන වර්ෂයේදී ශුද්ධ මුදල් ප්‍රවාහය රු…………… (ආ) පිළිගෙවුම් කාලය (වසර)…………………

### 2016 වර්ෂය අ. පො. ස. උසස් පෙළ ප්‍රශ්ණ අංක 30

අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය වැඩිවිමට පහත කුමන දෑ හේතු වේද

A- අපේක්ෂිත මුදල් ගලාඒම් වැඩි විම
B- ආරම්භක ආයෝජනයේ පිරිවැය අඩු විම
C.-වත්කමේ සුන්බුන් අගය වැඩි විම
D-. අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය වැඩි විම

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා D පමණි (4) A,B හා C පමණි
(5) A,B,C හා D සියල්ලම

## 2016 වර්ෂය අ. පො. ස. උසස් පෙළ ප්‍රශ්ණ අංක 50

සමාගමක් විසින් රු 2400 000 කට යන්ත්‍රයක් මිලදී ගැනීමට ෂලකා බලමින් සිටි එහි ඵලදායි ජීව කාලය සහ පිළිවෙළින් වසර 5 ක් සහ රු 600 000 ක් වේ ක්ෂය වෙන් කිරිම සදහා සරල මාර්ග ක්‍රමය භාවිත කරනු ලැබයි මෙම පහත දෑ ගණනය කරන්න

(අ) පිළිගෙවුම් කාලය (වසර)…………………………………..

(ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය - සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව (%)………………….

## 2017 වර්ෂය අ. පො. ස. උසස් පෙළ ප්‍රශ්ණ අංක 50

නිෂ්පාදන සමාගමක් පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලට ගැනිමට සලකා බලමින් සිටි මෙයට අදාළ ශක්‍යතා අධ්‍යනය පැවැත්විමට දරණ ලද පිරිවැය රු 50 000 කි මෙම මිලදී ගැනීමට අදාළව පහත ඇස්තමේනතු පිළියෙල කර ඇත

| | |
|---|---|
| නව යන්ත්‍රයේ පිරිවැය | රු 1 000 000 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් ආදායම | රු 300 000 |
| අතිරේක කාරක ප්‍රග්ධනය | රු 200 000 |
| ආයෝජනයේ පිළිගෙවුම් කාලය | වසර 3 |
| නව යන්ත්‍රයේ ඵලදායි ජිව කාලය | වසර 4 |

ශුද්ධ මෙහෙයුම් මුදල් ගලාඒම සෑම වසරක ම සමාන වේ යැයි උපකල්පනය කරන්න
පහත දෑ ගණනය කරන්න

(අ) මුලික මුදල් ගලායාම රු……………..

(ආ) අපේක්ෂිත වාර්ෂික ශුද්ධ මෙහෙයුම් මුදල් ගලාඒම රු……………….

## 2018 වර්ෂය අ. පො. ස. උසස් පෙළ ප්‍රශ්ණ අංක 50

සේවක කාර්‍ය සාධනය දියුණු කිරිම සදහා සමාගමක් එහි කර්මාන්තශාලාව වායුසමිකරණය කිරිමට තීරණය කරන ලදි වායුසමිකරණයේ පිරිවැය රු 1 500 000 ක් වේ එහි ඵලදායි ජිව කාලය වසර 5 ක් වන අතර සුන්බුන් අගයක් නොමැත සේවක කාර්‍යසාධනය වැඩි විම නිසා වාර්ෂික ආදායම රු 600 000 කින් වැඩි වේ යැයි ඇස්තමේන්තු කර ඇත තවද වායුසමිකරණය සදහා රු 240 000 ක අතිරේක නඩත්තු වියදමක් වාර්ෂිකව දැරිමට සිදු වේ මෙම යෝජිත ව්‍යාපෘතියට අදාළ පහත දෑ දක්වන්න

(අ) පළමු වර්ෂයේ ඇස්තමේන්තුගත ශුද්ධ මුදල් ප්‍රවාහය රු…………………….

(ආ) අපේක්ෂිත වාර්ෂික ශුද්ධ ලාභය රු ………………………

# ගිණුම්කරණය 11 ප්‍රශ්ණ පත්‍රයෙහි පසුගිය විභාග ප්‍රශ්ණ කිහිපයක්

## 2015 වර්ෂය අ. පො. ස. උසස් පෙළ

සමාගමක් මුද්‍රණාලක් ආරම්භ කිරිමට සැලසුම් කරමින් සිටි මේ සඳහා අවශ්‍ය කරන මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමට අදාළ මුදල් ප්‍රවාහ පහත දැක්වේ

| | රු 000 |
|---|---|
| ගැනුම් මිල | 2 000 |
| වැඩ බිම සකස් කිරිමේ වියදම් | 200 |
| සවිකිරිමේ ගාස්තු | 300 |

යන්ත්‍රයේ අපේක්ෂිත සුන්බුන් අගය ඵලදායි ජිව කාලය පිළිවෙලින් රු 500 000 ක් සහ වසර 4 ක් වේ ව්‍යාපෘතිය ආරම්භයේදී රු 500 000 ක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේදී නැවත ලබා ගත හැකිය
මුද්‍රණාලයේ අපේක්ෂිත ආදායම සහ මෙහෙයුම් වියදම් පහත පරිදි වේ

රු 000

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| ආදායම | 3 500 | 4 500 | 6 000 | 7 500 |
| මෙහෙයුම් වියදම් (ක්ෂය ද ඇතුළුව) | 2 000 | 3 000 | 3 500 | 4 000 |

ව්‍යාපෘතියේ 10%ක අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක ( පළමු දශමස්ථානයට)

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | -0.9 | 0.8 | 0.7 | 0.6 |

**අවශ්‍යවන්නේ:-** ව්‍යාපෘතිය සම්න්ධයෙන් පහත දෑ
(1) අන්තර්ගත අයිතම වෙන වෙන ද දක්වමින් ආරම්භක මුර් මුදල් ගලා යෑම
(2) වසර 1 සිට 4 දක්වා වාර්ෂික මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යෑම්
(3) ශුද්ධ වර්තමාන අගය
(4) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය මත පදනම් ව එහි යෝග්‍යතාව පිළිබඳ නිර්දේශය

## 2016 වර්ෂය අ. පො. ස. උසස් පෙළ

නිෂ්පාදන සමාගමක් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරිම සඳහා දැනට පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටි නව යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 5 කි පහත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් මෙම යන්ත්‍ර දෙක හා බැඳේ

| **විස්තරය** | **නව යන්ත්‍රය (රු 000)** | **දැනට පවතින යන්ත්‍රය ( රු 000)** |
|---|---|---|
| පිරිවැය | | |
| වර්තමාන වෙළෙඳපළ වටිනාකම | - | 300 |
| සුන්බුන් වටිනාකම | 200 | - |
| වාර්ෂික මෙහෙයුම් පිරිවැය | | |
| වර්ෂය 1 | 100 | 300 |
| වර්ෂය 2 | 100 | 300 |
| වර්ෂය 3 | 120 | 320 |
| වර්ෂය 4 | 120 | 320 |
| වර්ෂය 5 | 140 | 360 |

නව යන්ත්‍රය මිලදි ගන්නේ නම් ව්‍යාපෘතිය ආරම්භයේදී රු 280 000 ක අතිරේක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේ දී නැවත ලබා ගත හැකි ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% කි

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ**
(1) මෙම ව්‍යාපෘතියේ මුදල් ගලායාම් සහ මුදල් ගලාඒම් ඇතුළත් ලේඛනයක්
(2) ශුද්ධ වර්තමාන අගය
(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම් ව ව්‍යාපෘතිය තෝරාගැනීම පිළිබඳ නිර්දේශය

## 2017 වර්ෂය අ. පො. ස. උසස් පෙළ

පිරිවැය රු 1 200 000 ක් වන නව යන්ත්‍රයක් අත්ලත් කර ගැනීමට සමාගමක් ෂලකා බලමින් සිටි යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායි ජීව කාලය වර්ෂ 5 ක් වන අතර එහි සුන්බුන් අගය රු 200 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත මෙම යන්ත්‍රය භාණ්ඩයක් නිෂ්පදනය කිරිම සදහා භාවිත කරනු ලබන අතර එහි අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පහත පරිදි වේ

| **වර්ෂය** | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| **නිෂ්පාදන (ඒකක)** | 500 | 500 | 500 | 600 | 600 |

ඒකකයක අපේෂිත විකුණුම් මිල රු 2000 ක් වේ ඒකකයක අපේක්ෂිත ප්‍රාථමික පිරිවැය රු 1 000 ක් වන අතර වාර්ෂික නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (ක්ෂය ද ඇතුළුව) රු 300 000 ක් වනු ඇත ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය 10%ක් වේ

**අවශ්‍යවන්නේ**

(1) ව්‍යාපෘතියේ මුදල් ගලා ඒම් මුදල් ගලායාම් සහ ශුද්ධ වර්තමාන අගය (පිළිතුරු සැපයීමේදී පහත අකෘතියට සමාන අකෘතියක් භාවිත කරන්න )

**(රු 000)**

| වසර | 0 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|
| මුදල් ගලාඒම් | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| මුදල් ගලායාම් | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | | | | | | |
| 10% වට්ටම් සාධකය (දශමස්ථාන දෙකකට) | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |
| ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි වර්තමාන අගය | | | | | | |
| ව්‍යාපාතියේ ශුද්ධ වර්තමාන අගය | | | | | | |

ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ව්‍යාපෘතිය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිමේ නිර්දේශය

## 2018 වර්ෂය අ. පො. ස. උසස් පෙළ

සමාගමක් පිරිවැය රු 4 000 000 ක් වූ නව යන්ත්‍රයක් මිලදි ගැනීමට තිරණය කර ඇති අතර එහි අපෙක්ෂිත ඵලදායි ජීව කාලය වසර 4 ක් වේ 10%ක වට්ටම් සාධකය යටතේ මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය රු 600 000 ක් ධන ලෙෂ ගණනය කර ඇත කෙසේ වුවද මෙම ගණනය කිරිමේදී පහත මුදල් ප්‍රවාහ අයිතම සැලකිල්ට ගෙන නොමැති බව සමාගමේ ගණකාධිකාරීවරයා විසින් පසුව සොයා ගන්නනා ලදි

| **අයිතම අංකය** | **විස්තරය** | **වටිනාකම (රු 000)** |
|---|---|---|
| 1 | වාර්ෂික මෙහෙයුම් වියදම් ඉතිරිය | 300 |
| 2 | පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 200 |
| 3 | ව්‍යාපෘති කාලය අවසානයේදී නව යන්ත්‍රයේ විකුණුම් මිල | 500 |
| 4 | නව යන්ත්‍රයේ සවිකරිමේ ගාස්තු | 1 200 |
| 5 | මධ්‍යම පරිසර අධිකාරියට ගෙවිය යුතු වාර්ෂික දායක මුදල (පළමු වසර අවසානයේ සිට ගෙවිය යුතු වේ) | 200 |

10%වට්ටම් සාධක

| වසර | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|
| 10% වට්ටම් සාධකය | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 |

**අවශ්‍යවන්නේ**

(1) ඉහත අංක 1-5 දක්වා ඇති අයිතමවලට අදාළ වාර්ෂික මුදල් ගලාඒම් (+) ලෙස සහ ගලා යාම් (-) ලෙස අගයන් සහිතව දක්වන්න (පහත ආකෘතියට සමාන අකෘතියක් භාවිත කරන්න)

**(රු 000)**

| අයිතම අංකය | වසර | | | | |
|---|---|---|---|---|---|
| | 0 | 1 | 2 | 3 | 4 |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

(2) 10% වට්ටම් සාධකයේදී ව්‍යාපෘතියේ සංශෝධිත ශුද්ධ වර්තමාන අගය සහ නිර්දේශය

## 2019 වර්ෂය අ. පො. ස. උසස් පෙළ

සීමිත කැළුම් පොදු සමාගම පැරණි යන්ත්‍රයක් වෙනුවට නව යන්ත්‍රයක් අත්පත් කර ගැනීමට සලකා බලමින් සිටියි සමාගමේ කළමණාකාරණ ගණකාධිවරයා විසින් නව යන්ත්‍රය සම්බන්ධයෙන් පහත ඇස්තමේන්තුගත තොරතුරු සපයා ඇත

| | |
|---|---|
| ගැණුම් මිල | රු 1 200 000 |
| ඵලදායි ජීව කාලය | වසර 5 |
| සුන්බුන් අගය | රු 200 000 |
| ස්ථාපනය කිරිමේ ගාස්තුව | රු 75 000 |
| වැඩ බිම් සකස් කිරිමේ වියදම් | රු 125 000 |
| වාර්ෂික නඩත්තු පිරිවැය | රු 100 000 |

**අතිරේක තොරතුරු**

(i) නව යන්ත්‍රයේ අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු 300 000 ක්වන අතර මෙම ව්‍යාපෘතිය අවසානයේදී එය නාවත ලබා ගත හැකිය

(ii) නව යන්ත්‍රය නිසා මෙහෙයුම් පිරිවැයේ අපේක්ෂිත වාර්ෂික ඉතිරිය රු 500 000 කි

(iii) නව යන්ත්‍රය මිලදී ගත හොත් පැරණි යන්ත්‍රය ව්‍යාපෘතිය ආරම්භයේදී රු 400 000 කට විකිණිය හැකි යැයි ඇස්තමේන්තු කර ඇත

(iv) මෙම ව්‍යාපාතියේ ආපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය 12% කි

(v) 12% වට්ටම් සාධක

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.89 | 0.80 | 0.71 | 0.64 | 0.57 |

**අවශ්‍යවන්නේ**

(1) ව්‍යාපෘතියෙහි මුදල් ගලාඒම් සහ මුදල් ගලා යාම් ලේඛනය සහ එහි ශුද්ධ වර්තමාන අගය

(2) ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිලදී ගත යුතු ද යන නිර්දේශය